## ඉඩම් මැනුම් සභාව

### සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව, ඉඩම් මැනුම් සහ මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය හැසිරීම නියාමනය කිරීම සඳහා 2002 අංක 17 දරන මැනුම් පනත මගින් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති අර්ධ රාජ්‍ය ආයතනයකි. ඉඩම් මැනුම් සභාව සතු ප්‍රධාන රාජකාරීන් වන්නේ මිනින්දෝරුවරුන් ලියාපදිංචි කිරීම, වාර්ෂික මැනුම් බලපත්‍ර නිකුත් කිරීම, අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සහ ඉඩම් මැනුම් ක්ෂේත්‍රයට අදාළ පැමිණිලි විභාග කිරීම යනාදිය වේ.

පහත පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන සුදුසුකම් ලත් පුද්ගලයින් බඳවා ගැනීමට සභාව අපේක්ෂා කරයි.

**කළමනාකරණ සහකාර III ශ්‍රේණිය - පුරප්පාඩු 03.**

අධ්‍යාපන සුදුසුකම් :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී,
   (i) සිංහල/ දෙමළ
   (ii) ගණිතය
   යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිත ව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

(ආ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.

(ඇ). පරිගණක භාවිතය පිළිබඳව මාස හයකට (06) නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

වයස : අවු. 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි අය විය යුතු ය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

අභියෝග්‍යතා පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම, භාෂා ප්‍රවීණතාව සහ පරිගණක පරීක්ෂණය යන විෂයයන් තුනෙන් ලිඛිත තරග විභාගයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

මාසික වැටුප් පරිමාණය :

(MA-1-1) - රු. 27,910 - 10x300 - 7x350 - 4x495 - 20x660 - රු. 48,540.

වෙනත් ප්‍රතිලාභ :

1. සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම්
2. ආපදා ණය
3. උත්සව අත්තිකාරම්
4. රජයේ අනුමත ජීවන වියදම් දීමනාව සහ සමාන තත්ත්වයේ අර්ධ රාජ්‍ය ආයතන විසින් භුක්ති විඳින අනෙකුත් ප්‍රතිලාභ හිමි වේ.

අයදුම්පත්‍ර ලබාගන්නා ආකාරය :

www.landsurveycouncil.org වෙබ් අඩවියේ පළකර ඇති මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, අයදුම්කරු විසින් ඉදිරිපත් කළ විස්තර සහිතව PDF ආකෘතියේ අයදුම්පත්‍රයක් ලබාගත හැක.

**අයදුම්පත්‍ර යොමුකරන ආකාරය :**

එසේ ලබාගන්නා අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපත සහතික කර, අධ්‍යාපන සහතිකපත්‍රවල පිටපත් සහ ලංකා බැංකුවේ නාරාහේන්පිට ශාඛාවේ "සභාපති, ඉඩම් මැනුම් සභාව"නමින් ඇති අංක 0001658239 දරන ගිණුමට රු. 1,200/- ක විභාග ගාස්තු බැරකර ලබාගත් ලදුපත සමග පහත ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් 2024.08.12 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතු ය.** (මෙම ගාස්තුව කිසිලෙසකවත් නැවත ගෙවනු නොලබන බව කාරුණිකව සලකන්න) අයදුම්පත්‍රය බහා එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි "**කළමණාකරණ සහකාර තනතුර සඳහා**" යනුවෙන් සඳහන් කළ යුතු ය.

සභාපති,
ඉඩම් මැනුම් සභාව.

සර්වේයර් ජනරාල් කාර්යාලය,
අංක 150, බර්නාර්ඩ් සොයිසා මාවත,
කොළඹ 05.

07 - 378